රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 180.

මගේ අංකය : 2/9/361 (මෝ) 1/
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1980 ඔක්තෝබර් මස 16 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත.

රජයේ නිලධරයන් පත්කිරීම්, මාරුකිරීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලනය පිළිබඳ බලතල පැවරීම.

අංක 130 සහ 1978 ඔක්තෝබර් 18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇතුළත් වූ රජයේ නිලධරයන් පත්කිරීම්, මාරුකිරීම්, සේවයෙන් පහකිරීම් සහ විනය පාලනය පිළිබඳ බලතල පැවරීම, අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව, 1980.05.21 දින සිට බලපැවැත්වෙන සේ පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

(1) පත්කිරීම්

ඒකාබද්ධ සේවාවන්ට නොගැනෙන්නාවූත්, මාණ්ඩලික ශ්‍රේණිවල නොවූත් රජයේ නිලධරයන්

අවශ්‍ය අවස්ථාවන්හිදී දෙපාර්තමේන්තු නියෝජ්‍ය ප්‍රධානයන්ට පැවරීමට සහ එවැනි පැවරීම් අදාළ භාර අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලයෙන් ලබාගැනීම.

(ii) මාරුකිරීම්

මාණ්ඩලික ශ්‍රේණිවල නොගැනෙන රජයේ නිලධරයන්

යම් අවස්ථාවන්හිදී තම අවසරය ලබාගැනීමේ අවශ්‍යතාවය භාර අමාත්‍යවරයෙකුට ඇත්නම් හැර, තම බලය ලේකම්වරයෙකුට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානයෙකුට පැවරීමට ඉඩදීම.

(iii) සේවයෙන් පහකිරීම්

ඒකාබද්ධ සේවාවන්ට නොගැනෙන්නාවූත්, මාණ්ඩලික ශ්‍රේණිවල නොවූත් රජයේ නිලධරයන්

අවශ්‍ය අවස්ථාවන්හිදී දෙපාර්තමේන්තු නියෝජ්‍ය ප්‍රධානයන්ට පැවරීමට සහ එවැනි පැවරීම් අදාළ භාර අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලයෙන් ලබාගැනීම.

(IV) විනය පාලනය

(අ) ඒකාබද්ධ සේවාවන්හි මාණ්ඩලික ශ්‍රේණිවල රජයේ නිලධරයන්

ඒකාබද්ධ සේවාවන්හි එවැනි නිලධරයන්ගේ වැඩ තහනම් කිරීමේ බලය අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාට පවරා ඇත.

(ආ) ඒකාබද්ධ සේවාවන්හි නොගැනෙන්නාවූත්, මාණ්ඩලික ශ්‍රේණිවල වූත් රජයේ නිලධරයන්

අවශ්‍ය අවස්ථාවන්හිදී දෙපාර්තමේන්තු නියෝජ්‍ය/සහකාර ප්‍රධානයන්ට පැවරීම සහ එවැනි පැවරීම් අදාළ ගරු අමාත්‍යවරයා අමාත්‍ය මණ්ඩලයෙන් ලබාගැනීම.

(ඇ) ඒකාබද්ධ සේවාවන්හි මාණ්ඩලික ශ්‍රේණිවල නොවන රජයේ නිලධරයන්

සේවයෙන් පහකිරීම, සේවය අවසන් කිරීම හෝ අකාර්යක්ෂමතාවය මත අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම යන දඬුවම් හැරෙන්නට සුළු දඬුවම් පැමිණවීමේ බලය අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා දෙපාර්තමේන්තු ප්‍රධානයන්ට පවරා ඇත.

02. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තමාට විරුද්ධව පනවනු ලද, සේවයෙන් පහකිරීම නොවන්නාවූ විනය නියෝගයකට එරෙහිව මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයකුගේ එන් අභියාචනයක් සලකා බැලීමේ බලයද අමාත්‍ය මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පවරා ඇත.

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

රා/22.